**සිරිකුමාර, එච්.කේ.එස්.**
PAPER

**නාගරීකරණයත් සමඟ වර්තමාන පවුල් සංස්ථාවේ වෙනස්වීම පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක්**

**එච්.කේ.එස්.සිරිකුමාර, සමාජ විද්‍යා අධ්‍යානාංශය**

මිනිසා වනචාරී යුගය පසුකරමින් කාර්මික ගුයක් කරා ගමන් කිරීමත් සමඟ සමාජ පද්ධතියේ එතෙක් පැවති සාමූහික විඥානය වෙනුවට පෞද්ගලික දිශානතියකට පුද්ගලයා ගමන් කිරීමත් සමඟ සමාජය විශාල විපර්යාසයට සිදුවිය. සාමූහිකව ජීවත් වූ මිනිසා තමා හා අවට පරිසරය පිළිබඳ පෞද්ගලික හැඟීමකින් යුතුව සිතීමට පටන්ගත්තේ ජනගහනයේ වර්ධනය ශ්‍රම විභජනය ආදී කරුණු කාරණා හේතුකොටගෙනය. සාමූහිකව ජීවත් වූ ජනයා පෞද්ලික දිශානතියකට ගමන් කිරීම සමාජයේ පෙර පැවති සමාජ ක්‍රමය බිඳ වැටීමට හේතුවක් විය. විස්තාරික පවුල් ක්‍රමයක් ක්‍රම ක්‍රමයෙන් බිහිවිය. මේ සමඟම ග්‍රාමීය සමාජයද වෙනස් වීමට ලක්විය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වැඩ බෙදී තිබුණ ද ඒ යුගයේ සරල වූ ශ්‍රම විභජනයක් පැවතිණ. විශේෂයෙන් කාන්තාවන්ලේ දායකත්වය පවුල් වලට එක් වූයේ ඉතා සරල මට්ටමිනි. නමුත් වර්තමානය වන විට කාන්තාව පවුලේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. සාම්ප්‍රදායික කාන්තාවගේ කාර්යභාරය වෙනස්ව මුදල් පසුපස හබායන පිරිසක් අද වන විට බිහිවී ඇති ආකාරය සහ එමඟින් සමාජයට පවුල් සංස්ථාවට දරුවන්ට, අඹුසැමි සබඳතාවන්ට විශාල ලෙස බලපෑම් ඇතිකර තිබේ. අද වේගයෙන් ග්‍රාමීය සමාජය නාගරීකරණය වෙමින් පවතී. එනම් උපනගර, නගර, මහනගර බිහිවෙමින් පවතී. ඒ සමඟම සාම්ප්‍රදායික පවුල් සංස්ථාවද වෙනස් වෙමින් නවීකරණයේ ලක්ෂණ එකතුව තිබේ. ඒ අනුව මෙම ශාස්ත්‍රීය පෙළගැස්ම හරහා නාගරීකරණයක් සමඟ වර්තමාන පවුල් සංස්ථාව කවරාකාර වෙනස්වීම්වලට භාජනය වී ඇත්ද යන්න මෙහිදී විග්‍රහ කෙරේ.